# ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල පුස්තකාලයන්හි පාඨක ප්‍රජාවගේ චර්යාවන් එම පුස්තකාල සඳහා සිදු කරනු ලබන අයහපත් බලපෑම් පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්ඃ

කැලණිය, කොළඹ, ජයවර්ධනපුර විශ්වවිද්‍යාල පුස්තකාල ඇසුරින්


යමුනා සමන්මලී උඩුමලගල

පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය


## ABSTRACT


විවිධ පුස්තකාලවල පාඨක අවශ්‍යතාවයට අනුව පුස්තකාල සම්පත් රැස් කිරීම හා ලබා දීමේ ක්‍රියාවලියේ දී පාඨකයන්ගේ චර්යාවන් හේතුවෙන් එම සම්පත්වලට හානි පැමිණීමේ තත්ත්වයන් ස්වභාවිකව පුස්තකාල තුළ ඇති වී තිබේ. මානව ක්‍රියාකාරකම් හේතුකොට ගෙන සියලු ම ආකාරයේ සේවාවන්ට යම් යම් ගැටළු ඇතිවේ.

බුද්ධිමත් පිරිසකගෙන් සැදුම්ලත් ආයතන විශේෂයක් වන විශ්වවිද්‍යාලයේ හදවත බඳු වූ පුස්තකාලයන්හි පාඨක ප්‍රජාවගේ චර්යාව එම විශ්වවිද්‍යාල පුස්තකාල කෙරෙහි සිදුකරනු ලබන අයහපත් බලපෑම් පිළිබඳ තුලනාත්මකව අධ්‍යයනය කිරීම, ඒ කෙරෙහි බලපා ඇති සාධක හඳුනා ගැනීම සහ එම බලපෑම් අවම කිරීමට යොජනා ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු විය.

මෙම අධ්‍යයනයේ දී පුස්තකාල යනු, පුස්තකාල වර්ග යනු, මානව චර්යාව එහි සාධනීය අසාධනීය භාවය හා විශ්වවිද්‍යාල පාඨකයාගේ චර්යාව පිළිබඳ තොරතුරු රැස්කරන ලදී. මෙම අධ්‍යයනය සඳහා සමීක්‍ෂණ පරීක්ෂණ ක්‍රමය භාවිත කෙරිණිග නිරීක්ෂණ ක්‍රමයද යොදා ගැණිනිග පර්යේෂණය සඳහා විශ්වවිද්‍යාල තුනක් සමීක්‍ෂණ සංගහනයට ඇතුළත් කෙරුණු අතර, එක් විශ්වවිද්‍යාලයක් සඳහා පාඨකයන පනස් දෙනෙකු ද, නිරීක්‍ෂණ සංගහනය සඳහා එක් විශ්වවිද්‍යාලයකින් පොත් 100 ක් හා එක් දිනක් පුස්තකාල පාඨකයාගේ චර්යාව පිළිබඳව සොයා බැලීම සඳහා උපයෝගී කර ගන්නා ලදි.

විශ්වවිද්‍යාල පුස්තකාල තුළ අයහපත් පාඨක චර්යා සිදුවන බවත්, ඉන් පුස්තකාලට යම් බලපෑමක් සිදුවන බවත් හඳුනා ගැනීමට හැකි විය. අවසාන වශයෙන් මෙම තත්ත්වයට බලපෑ හේතු ලෙස විශ්වවිද්‍යාල තුළ නිසි පරිදි පඨක අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක නොවීම, විශ්වවිද්‍යාල පුස්තකාල තුළ ඇති පහසුකම් ප්‍රමාණය අවමවීම හා විශ්වවිද්‍යාල පාඨකයා තුළ පුස්තකාල භාවිතය පිළිබඳ නිසි අවබෝධයක් නොවීම යනාදියයි. මෙම තත්ත්වය ස්ථිර වශයෙන් වැලැක්විය නොහැක. නමුත් මෙම තත්ත්වය අවම කර ගැනීම සඳහා අදාළ විසඳුම් යෝජනා ලෙස නිතර පාඨක අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීමට වෙනම ම අංශයක් ඇතිකිරීම, එමගින් උපදේශන හා පඨක අධ්‍යාපනික සේවාවන් ලබාදීම, ආරක්ෂිත උපකරණ යොදාගැනීම, හානි පිළිබඳ දැනුවත් කිරීමට දැන්වීම් පුවරු හා විනාශ වූ පොත්පත් ප්‍රදර්ශනයට තැබීම. පුස්තකාල සෙවාව දිවා රාත්‍රී පුරා ලබා දීමට කටයුතු කිරීම වැනි දෑ ඉදිරිපත් කර ඇත.



මූලික පද ඃ පුස්තකාල සේවා, විශ්වවිද්‍යාල පුස්තකාල, මානව චර්යා, අයහපත් පාඨක චර්යා